කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

2020 මැයි මස 06 දින සඳහා කාලගුණ අනාවැකිය

2020 මැයි මස 06 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

ඉදිරි දිනවලදී දිවයිනේ බොහෝ ප්‍රදේශවල සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි ඇතිවීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී.

බස්නාහිර, මධ්‍යම, සබරගමුව, වයඹ, දකුණු, ඌව සහ උතුරු මැද පළාත්වලත් මන්නාරම, වව්නියාව, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවලත් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත්වලත් කළුතර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී.75 වැඩි තරමක තද වර්ෂාපතනයන්ද ඇති වේ.

දකුණු සහ බස්නාහිර පලාත්වලත් පුත්තලම, මන්නාරම සහ යාපනය දිස්ත්‍රික්කවලත් වෙරළබඩ ප්‍රදේශවල උදෑසන කාලයේදීත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට අකුණු මගින් සහ තාවකාලික තද සුළං මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR 06 MAY 2020

**Issued at 05.30 a.m. on 06 May 2020**

**The possibility for evening thundershowers is high over most parts of the island during next few days.**

Showers or thundershowers will occur at several places in Western, Central, Sabaragamuwa, North-western, Southern, Uva and North-central provinces and in Mannar, Vauniya, Batticaloa and Ampara districts in the evening or night.

Fairly heavy falls above 75 mm are likely at some places in Sabaragamuwa, Central and Uva provinces and in Kaluthara, Galle and Matara districts.

Showers or thundershowers are likely over coastal areas of Southern and Western provinces and in Puttalam, Mannar and Jaffna districts during the morning too.

General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity and localized strong winds during thundershowers.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

# WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

## ඉදිරි පැය **24** ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය

2020 මැයි මස 06 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

### වැසි තත්ත්වය:

දකුණු අන්දමන් මුහුද සහ ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව වර්ධනයවූ අඩු පීඩන තත්ත්වය තවදුරටත් පවතී. ගැඹුරු මුහුදු ප්‍රදේශ වල ධීවර හා නාවුක කටයුතු වල යෙදීමේදී මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මන්නාරම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

### සුළඟ:

මන්නාරම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළං ගිනිකොණ දෙසින් හමා එන අතර සුළඟේ වේගය පැ.කි.මී. **(25-35)** පමණ වේ.
ගාල්ල සිට හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. **(40-45)** පමණ දක්වා ඉහළ යා හැක.

### මුහුදේ ස්වභාවය:

කොළඹ සිට ගාල්ල හරහා මාතර දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශ වල මුහුදු රළ මීටර්. **2.0-2.5** ක් පමණ (මෙය ගොඩබිමට එන රළ උස නොවේ) ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.

ගාල්ල සිට හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. **70-80** දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2020/05/06
Time : 0532hrs
D(EOC)/DD/ADO
DISASTER MANAGEMENT CENTRE

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

**Issued at 05.30 a.m. on 06 May 2020**

## Condition of Rain:

**The low pressure area developed over south Andaman Sea and adjoining Southeast Bay of Bengal sea area persists over the same region further. Fishing and naval community are requested to be vigilant in this regards in the deep sea area.**

Showers or thundershowers will occur at several places in the sea area extending from Mannar to Batticaloa via Colombo, Galle and Hambantota.

## Winds:

Winds will be South-westerly in the sea area extending from Mannar to Batticaloa via Colombo, Galle and Hambantota and winds will be South-easterly in the other sea areas around the island. Wind speed will be (25-35) kmph.

Wind speed can increase up to **(40-45) kmph** at times in the sea areas extending from Galle to Batticaloa via Hambanthota.

## State of Sea:

There is a possibility that near shore sea areas off the coast extending from Colombo to Matara via Galle, may experience surges due to the effect of swell waves, having 2.0-2.5m height (This is not for land area).

The sea area extending from Galle to Batticaloa via Hambanthota can be fairly rough at times. The other sea area around the island can be moderately rough.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and rough seas can be expected during thundershowers.**

2020/05/06
0532hrs

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි